# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1370/11 – 2004 දෙසැම්බර් 08 වැනි බදාදා – 2004.12.08

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමිය විසින් කරන ලද ප්‍රකාශන ආදිය

යොමු අංකය : එස්පී/6/එන්/231/2003.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසිනි

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග,

මුද්‍රාව

1. විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරු ගරු ජිනසේන වික්‍රම එදිරිසූරිය මැතිතුමා,
2. විශේෂඥ වෛද්‍ය දිල්කුෂි අනුලා විජේසුන්දර මැතිතුමිය,
3. මහාචාර්ය මැන්දිස් රෝහණදීර මැතිතුමා,

වෙතය.

*ශුභාශිංසන පෙරටුවයි* !

පූජ්‍ය ගංගොඩවිල සෝම ස්ථවිරයන් වහන්සේගේ අපවත්වීම වර්ෂ 2003 දෙසැම්බර් මස 12 වන දින රුසියාවේ සාන්ත පීටර්ස්බර්ග් නුවරදී සිදුවී ඇති හෙයින් ද,

පූජ්‍ය ගංගොඩවිල සෝම ස්ථවිරයන් වහන්සේ අපවත් වීමට හේතුවූ කාරණය සම්බන්ධයෙන් හා උන්වහන්සේගේ අපවත්වීම සිදුව තිබෙන අවස්ථාගත තත්ත්වයන් ගැන බොහෝ චෝදනා ඉදිරිපත් කරනු ලැබ තිබෙන හෙයින් ද,

මෙහි මින්මතු සඳහන් කරනු ලබන කාරණා පරීක්ෂණයට භාජනය කිරීම මාගේ අදහසේ හැටියට මහජන යහපතට හේතුවන හෙයින්, එකී කාරණා ගැන පරීක්ෂණ කොමිෂන් සභාවක් පත්කිරීම අවශ්‍යයි මා හට පෙනී යන හෙයින් ද,

ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග වන මම ඔබතුමාගේ විචක්ෂණභාවය, සාමාර්ථය හා විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින් (393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තියෙහි විධිවිධානවලට අනුකූලව පෙරකී,

ගරු ජිනසේන වික්‍රම එදිරිසූරිය මැතිතුමා,

විශේෂඥ වෛද්‍ය දිල්කුෂි අනුලා විජේසුන්දර මැතිතුමිය,

මහාචාර්ය මැන්ඩිස් රෝහණධීර මැතිතුමා.

වන ඔබතුමන්ලා පහත සඳහන් කාරණා ගැන පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා මාගේ කොමසාරිස්වරුන් ලෙස පත්කරමි.

(අ) පූජ්‍ය ගංගොඩවිල සෝම ස්ථවිරයන් වහන්සේගේ අපවත්වීම ස්වභාවික හේතු නිසා සිදුවූයේ ද යන වග, එසේ වී නම් එම නිගමනය තහවුරු කෙරෙන සාක්ෂි මොනවාද, නොඑසේ වී නම් උන්වහන්සේගේ අපවත්වීම වෙනත් යම් හේතුවක් නිසා සිදුවී තිබේදැයි දැක්වීමට තිබෙන විශ්වාසනීය හා අනුමාන සාක්ෂි මොනවාද ?

(ආ) පූජ්‍ය සෝම ස්ථවිරයන් වහන්සේ අපවත්වීමට ප්‍රථම, විශේෂයෙන්ම උන්වහන්සේ දිවයිනෙන් පිටත්ව යෑම හා රුසියාවේදී අපවත්වීම අතර කාලය තුළ උන්වහන්සේට වැළදුණු යම් අසනීපයක්/අසනීප වේ නම් ඒ පිළිබඳ ඉදිරිපත් කිරීමට තිබෙන වෛද්‍යමය සාක්ෂි හෝ වාර්තා මොනවාද ?

(ඇ) පූජ්‍ය සෝම ස්ථවිරයන් වහන්සේ කෙරෙහි කිසියම් එදිරිවාදිකමක් ඇති කිරීමට වගකිව යුතු යම් සංවිධානය වූ හෝ සංවිධානය නොවූ පුද්ගලයින්, කණ්ඩායම් හෝ ආයතන වූයේද යන වග,

(ඈ) වර්ෂ 2003 ඔක්තෝබර් මස 11 වැනි දින හෝ ඊට ආසන්න කාලසීමාවක පූජ්‍ය සෝම ස්ථවිරයන් වහන්සේ රුසියාවට සිදුකළ ගමනට තුඩුදුන් අවස්ථාගත තත්ත්වයන් කුමක්වීද, ගමනේ පරමාර්ථය කුමක්ද, එකී ගමන පෞද්ගලික ගමනක් වීද, එසේ නොවීද, එකී ගමන සංවිධානය කිරීමට වගකිවයුතු පුද්ගලයෝ හෝ කණ්ඩායම් වූවෝ නම් ඔවුහු කවරහුද, නොඑසේ නම් එකී ගමන පූජ්‍ය සෝම ස්ථවිරයන් වහන්සේ විසින් සම්පූර්ණයෙන්ම ස්වේච්ඡාවෙන්ම සිදුකරන ලද්දක්ද යන කරුණු,

(ඉ) පූජ්‍ය සෝම ස්ථවිරයන් වහන්සේගේ අපවත්වීම කිසියම් කුමන්ත්‍රණයක් හෝ උපක්‍රමයක් නිසා සිදුවී යැයි විශ්වාස කිරීමට හේතු තිබේද, එසේ වී නම්, ඒ සම්බන්ධයෙන් තිබෙන සාක්ෂි මොනවාද? යන්න,

තවද, පෙරකී විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිසුරු, ගරු ජිනසේන වික්‍රම එදිරිසූරිය වන ඔබ පූර්වෝක්ත කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස මම මෙයින් පත් කරමි.

තවද, පෙරකී කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය යයි ඔබතුමන්ලාට පෙනී යන සියළු පරීක්ෂණ පැවැත්වීමට සහ වෙනත් සියළු විමර්ශණයන් කිරීමට පෙරකී කොමසාරිස්වරුන් වන ඔබතුමන්ලාට මෙයින් අධිකාරය හා බලය දෙන අතර, මෙම අධිකාරී බලපත්‍රයේ දින සිට තුන්මසක් ඇතුළත ඔබතුමන්ලාගේ පරීක්ෂණවල නිගමන හා ඒවාට අදාළ ඔබතුමන්ලාගේ නිර්දේශයන් ඇතුළත් වාර්තාව හෝ අතුරු වාර්තා ඔබතුමන්ලාගේ අත්සනින් මාහට ඉදිරිපත් කරන ලෙස මෙයින් නියම කරමි.

තවද, පෙරකී කාරණාවලට සම්බන්ධ පරීක්ෂණවල යම් කොටසක් ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු යයි ඔබතුමන්ලාගේ අභිමතය ප්‍රකාර නිශ්චය කරනු ලැබේ නම් එම කොටස් ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු යයි මම මෙයින් නියම කරමි.

තවද, ඔබතුමන්ලාගේ පරීක්ෂණවල කාර්යය සඳහා ඔබතුමන්ලා විසින් සහාය හෝ තොරතුරු ඉල්ලා සිටිය හැකි සියළු රජයේ නිලධරයන් සහ වෙනත් තැනැත්තන් විසින් ඒ සඳහා නිසි පරිදි දියහැකි සියළු සහාය දියයුතු යයිද, සැපයිය හැකි සියළු තොරතුරු සැපයිය යුතු යයි ද මෙයින් නියම කොට විධාන කරමි.

තවද, පරීක්ෂණ කොමිෂන් සභා පනතේ (393 වන අධිකාරය) 14 වන වගන්තියේ විධිවිධානයන් මෙම කොමිෂන් සභාවට අදාළ විය යුතුයැයි මම මෙයින් ප්‍රකාශ කරමි.

වර්ෂ දෙදහස්හතරක් වූ දෙසැම්බර් මස පළමුවැනි දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමියගේ අණ පරිදි,

ඩබ්ලිව්. ජේ. එස්. කරුණාරත්න,
ජනාධිපති ලේකම්.

12-667

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.